රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**
ඉංජිනේරු සේවා අංශය, பொறியியல் சேவைப் பிரிவு, Engineering Services Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
Website : www.pubad.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකතන<br>தொலைபேசி:<br>Telephone | 011-2696211-13 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | information@pubad.gov.lk |
| අධ්‍යක්ෂ<br>பணிப்பாளர்<br>Director | 011- 2698268 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011- 2698268 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | esbpubad@gmail.com |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | ES/1/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி:<br>Date | 2020.01.06 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2138/27 හා 2019.08.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම</u>**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට සහ දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය සංශෝධනය කිරීමට අදාළ විධිවිධාන ඇතුලත් කර අංක 2138/27 හා 2019 අගෝස්තු මස 28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ පස්වන සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට සේවයේ සිටින ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක 39/2019 හා 2019.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, (ඇමුණුම 01) මෙම ලිපිය සමඟ අවශ්‍ය කටයුතු සඳහා ඔබ වෙත යොමු කරමි.

02. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්, සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 39/2019 අනුව දෙවන (II) ශ්‍රේණියට උසස් වීම සඳහා ඉල්ලුම් කිරීමේදී මෙම ලිපිය සමඟ අමුණා ඇති ඉල්ලුම් පත්‍රය (ඇමුණුම 02) සම්පූර්ණ කර ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු වන අතර ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. ඔබ ආයතනයේ සුදුසුකම් ලත් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීමේදී, මෙම ලිපිය සමඟ අමුණා ඇති EST-11(Gr.II) නව ආකෘති පත්‍රය (ඇමුණුම 03) නිලධාරීන්ගේ පත්වීමේ දින අනුපිළිවෙල අනුව නිවැරදිව සම්පූර්ණ කර අදාළ අමාත්‍යාංශ ලේකම් හෝ පළාත් ප්‍රධාන ලේකම් මගින් ඉදිරිපත් කරන ලෙස දන්වමි. එමෙන්ම අදාළ ආකෘති පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර එවීම පමණක් ප්‍රමාණවත් වන අතර වෙනත් ලේඛන ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වමි. එහෙයින් නිලධාරීන්ගේ නිවැරදි හා සත්‍ය තොරතුරු ඇතුළත් කර අදාළ ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන්නේ නම් මැනවි.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 39/2019 (ඇමුණුම 01), අදාළ ඉල්ලුම් පත්‍රය (ඇමුණුම 02) හා EST-11(Gr.II) නව ආකෘති පත්‍රය (ඇමුණුම 03) www.pubad.gov.lk වෙබ් අඩවියෙහි පළ කර ඇති බව වැඩිදුරටත් දන්වමි. එමෙන්ම ඔබ විසින් නිවැරදිව සම්පූර්ණ කරන ලද EST-11(Gr.II) නව ආකෘති පත්‍රයේ (ඇමුණුම 03) මුල් පිටපතට අමතරව එහි මෘදු පිටපතක් Times New Roman හෝ Iskola Potha අක්ෂර භාවිතයෙන් Microsoft Excel මගින් සකස් කර desb@pubad.gov.lk දරන විද්‍යුත් තැපැල වෙත යොමු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**ඉංජි. ඩබ්.කේ. එස්. වික්‍රමපාල**
අධ්‍යක්ෂ (වැ.බ)
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

ඇමුණුම 02

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 39/2019 අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ නිලධාරීන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය</u>**

**I කොටස**

01. (අ) නිලධාරියාගේ නම : ..........................................................................................

(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තුන්වන (III) ශ්‍රේණියට පත් වූ දිනය : ......................................

(ඇ) තනතුරෙහි ස්ථිර කර ඇති දිනය : ..........................................................................

02. (අ) වර්තමාන තනතුර හා සේවා ස්ථානය : ....................................................................

..........................................................................................................................

(ආ) රාජකාරි ලිපිනය : ..........................................................................................

03. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට බඳවා ගත් පිළිවෙළ : විවෘත පදනම මත / සීමිත පදනම මත

04. පහත සඳහන් විභාගයන් සමත් වී සිටීද?

| විභාගය | සමත් වූ දිනය |
|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | |
| අනෙක් රාජ්‍ය භාෂා (සිංහල / දෙමළ) ප්‍රවීණතාවය | |

05. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II ශ්‍රේණියේ පිහිටුවීමට හිමිකම් ලබන දිනය : .................................

06. (අ) II ශ්‍රේණියට උසස් කරනු ලැබීමට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබේද? ..........................................................................................

(ආ) උසස් කරනු ලැබීමට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සිදු කර ඇති කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ විනයානුකූල දඬුවමකට භාජනය වී සිටියේද? ..............................................

(එසේ නම් විස්තර) ..............................................................................................

..........................................................................................................................

07. වර්තමාන වාර්ෂික වැටුප : ...................................................................................

08. ඔබ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට පත් වූ දින සිට මේ දක්වා වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබා ගෙන තිබේද? ..................................................................................................
(එසේ නම් විස්තර) ..................................................................................................
..................................................................................................

ඉහත 05 ඡේදයේ සඳහන් කර ඇති දිනට මා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වන ශ්‍රේණියට උසස් කරනු ලැබීමට සුදුසුකම් ලබා ඇති බවත් ඉහත 01 සිට 08 දක්වා ඇති විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

දිනය :................................ ................................................

අයදුම්කරුගේ අත්සන

II කොටස

<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

(පහත දක්වා ඇති කරුණු සම්බන්ධව දෙපාර්තමේන්තු ප්‍රධානීන් පෞද්ගලිකවම වගකිව යුතු වේ.)

.................................................................................................. මහතා / මහත්මිය / මෙනවිය
.................................................................................................. අමාත්‍යාංශයේ /
පළාත් සභාවේ / දෙපාර්තමේන්තුවේ ............................................................ ලෙස සේවය කරන බවත්,

- පත්වීමේ දින සිට වසර හයක (06) කාලය තුළ සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇති බවත් / නැති බවත්,
- II වන ශ්‍රේණියට උසස් කරනු ලැබීමට පූර්වාසන්න හය අවුරුදු කාලය තුළ සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති බවත් / නැති බවත්,

| වර්ෂය | වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති / නැති බව |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

- අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 06 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති බවත් / නැති බවත්,

| **වර්ෂය** | **සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති / නැති බව**<br>[සතුටුදායක (S) / සාමාන්‍ය ප්‍රමාණයට ඉහළ (A) / විශිෂ්ඨ (E)] |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

- නිලධාරියාට / නිලධාරිනියට විරුද්ධව කිසිඳු විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන හෝ එසේ විනයානුකූලව කටයුතු කිරීමට අදහසක් ඇති බවත් / නැති බවත්,
- නිලධාරියා / නිලධාරිනිය වැටුප් රහිත නිවාඩු ලබා නොමැති බවත්, ............................ දින සිට ................................ දින දක්වා වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබා ගෙන ඇති බවත් / නැති බවත් සහතික කරමි.
- මෙම නිලධාරියාගේ / නිලධාරිනියගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බැවින් ................................... දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

දිනය : ............................

.........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

* අනවශ්‍ය වචන කපා හරින්න.

**III කොටස**

............................................................................................................... මහතා / මහත්මිය / මෙනවිය

............................ දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි / නොකරමි.

දිනය : ............................

.........................................................................

අමාත්‍යාංශ ලේකම් / පළාත් ප්‍රධාන ලේකම් අත්සන

(නිල මුද්‍රාව)

# <u>II ශ්‍රේණියට උසස් කිරීම</u>

| අනු අංකය | නම | ජාතික හැඳුනුම්පත් අංකය | III ශ්‍රේණියට පත්වීම් ලද දිනය | සේවයට වාර්තා කළ දිනය | සේවය ස්ථිර කළ දිනය | පරිවාස කාලය දීර්ඝ කර තිබේ නම් කාල සීමාව හා කුමන ප්‍රතිපාදන යටතේද සඳහන් කරන්න (Ecode 11:9, 11:10 හෝ PSC rules 110, 111) | I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු දිනය හා සමත් වූ දිනය | අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු දිනය හා ලබාගත් දිනය | අමතර කාල සීමාවක් එකතු කළ යුතුද යන්න (තිබේ නම්) | III ශ්‍රේණියේ වසර 06ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? සහ වැටුප් වර්ධක 06ක් උපයාගෙන තිබේද? | උසස් කිරීමේ දිනට පෙර වසර 06ක සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේද? | උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 05 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? | උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? [සතුටුදායක (S) / සාමාන්‍ය ප්‍රමාණයට ඉහළ (A) / විශිෂ්ය (E)] | නිලධාරියා / ට | | II ශ්‍රේණියට උසස් වීම සඳහා සුදුසුකම් සපුරන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | ලබාගත් වැටුප් රහිත නිවාඩු (කාල සීමාව සඳහන් කරන්න) | එරෙහිව නොනිමි විනය කටයුතු තිබේද? (1වන හෝ 2වන උපලේඛනය යටතේ) | |
| | | | | | | | | | | | | 2014 - .......<br>2015 - .......<br>2016 - .......<br>2017 - .......<br>2018 - ....... | 2014 - .......<br>2015 - .......<br>2016 - .......<br>2017 - .......<br>2018 - ....... | | | |
| | | | | | | | | | | | | 2014 - .......<br>2015 - .......<br>2016 - .......<br>2017 - .......<br>2018 - ....... | 2014 - .......<br>2015 - .......<br>2016 - .......<br>2017 - .......<br>2018 - ....... | | | |

ඉහත තොරතුරු නිවැරදි බවත්, අදාළ ලිපිලේඛන හා සැසඳෙන බවත්, සහතික කරමි. ඒ අනුව ඉහත නිලධාරීන්ගේ උසස් වීම් නිර්දේශ කර කරු. අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

සකස් කළේ : .............................................
අත්සන / නම / තනතුර

.....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

අදාළ ලිපිලේඛන
සමඟ
පරීක්ෂා කළේ : .............................................
අත්සන / නම / තනතුර

<u>සටහන</u>
අදාළ නොවන තීරු සඳහා කරුණාකර “N/A” (අදාළ නොවේ) ලෙස සඳහන් කරන්න